# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2178/17 - 2020 ජුනි මස 02 වැනි අඟහරුවාදා - 2020.06.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

**ජනාධිපති විධානය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කිරීම.

1. පුරාවිද්‍යා චක්‍රවර්තී පූජ්‍ය එල්ලාවල මේධානන්ද නායක ස්වාමීන් වහන්සේ
2. උතුර සහ නැගෙනහිර දෙපළාතේ සහ තමන්කඩුව දිශාවේ ප්‍රධාන සංඝනායක<br>අරිසිමලේ ආරණ්‍ය සේනාසනාධිපති පූජ්‍ය පනාමුරේ තිලකවංශ නායක ස්වාමීන් වහන්සේ
3. මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා<br>ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
4. ආචාර්ය සෙනරත් බණ්ඩාර දිසානායක මැතිතුමා<br>පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
5. චන්ද්‍රා හේරත් මැතිතුමිය<br>ඉඩම් කොමසාරිස් ජනරාල්
6. ඒ. එල්. එස්. සී. පෙරේරා මැතිතුමිය<br>මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව
7. මහාචාර්ය රාජ් කුමාර් සෝමදේව මැතිතුමා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැළණිය විශ්වවිද්‍යාලය
8. මහාචාර්ය කපිල ගුණවර්ධන මැතිතුමා<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෛද්‍ය පීඨය
9. දේශබන්දු තෙන්නකෝන් මැතිතුමා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, බස්නාහිර පළාත
10. එච්. ඊ. එම්. ඩබ්ලිව්. ජී. දිසානායක මැතිතුමා<br>පළාත් ඉඩම් කොමසාරිස්, නැගෙනහිර පළාත
11. දිලිත් ජයවීර මැතිතුමා<br>සභාපති, දෙරණ මාධ්‍ය ජාලය



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වෙත,

ශුභාශිංසන පූර්වකවය!

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි සඳහන් කොට ඇති පරිදි ශ්‍රී ලංකාවේ ඓතිහාසික උරුමයන් සංරක්ෂණය කොට අනාගත පරපුරට උරුමකර දීම රජයේ වගකීමක් බව අවධානයට යොමුකරමින් ද,

ශ්‍රී ලංකාද්වීපය ශ්‍රේෂ්ඨ, ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියනු ලබන බවත්, රටක පුරාවිද්‍යාත්මක උරුමයන් එකී දේශයෙහි අනන්‍යතාවය ගොඩනැගීමෙහි ලා මෙන්ම එහි ඓතිහාසික විකාශනය පිළිඹිඹු කරනු ලබන මූලාශ්‍රයන් වන බවත්, සැලකිල්ලට ගනිමින් ද,

මෙකී උරුමයන් කාලයත් සමග ස්වභාවික මෙන්ම, මිනිසා විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් හේතුවෙන් පරිහානියට පත්වීමේ අනතුරුදායක තත්ත්වයක් ක්‍රමක්‍රමයෙන් උද්ගත වෙමින් පවතින බැව් සැළකිල්ලට ගනිමින් ද,

ශ්‍රී ලංකාව ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද මෙවැනි උරුමයන් ආරක්ෂා කිරීම සඳහා වන විවිධ සම්මුතීන් පිළිගෙන ඇති බව අවධානයට යොමු කරමින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම්,

1. පුරාවිද්‍යා චක්‍රවර්තී පූජ්‍ය එල්ලාවල මේධානන්ද නායක ස්වාමින් වහන්සේ
2. උතුර සහ නැගෙනහිර දෙපළාතේ සහ තමන්කඩුව දිශාවේ ප්‍රධාන සංඝනායක<br>අරිසිමලේ ආරණ්‍ය සේනාසනාධිපති පූජ්‍ය පනාමුරේ තිලකවංශ නායක ස්වාමින් වහන්සේ
3. මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා<br>ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
4. ආචාර්ය සෙනරත් බණ්ඩාර දිසානායක මැතිතුමා<br>පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
5. චන්ද්‍රා හේරත් මැතිතුමිය<br>ඉඩම් කොමසාරිස් ජනරාල්
6. ඒ. එල්. එස්. සී. පෙරේරා මැතිතුමිය<br>මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව
7. මහාචාර්ය රාජ් කුමාර් සෝමදේව මැතිතුමා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැළණිය විශ්වවිද්‍යාලය
8. මහාචාර්ය කපිල ගුණවර්ධන මැතිතුමා<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෛද්‍ය පීඨය
9. දේශබන්දු තෙන්නකෝන් මැතිතුමා<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, බස්නාහිර පළාත
10. එච්. ඊ. එම්. ඩබ්ලිව්. ජී. දිසානායක මැතිතුමා<br>පළාත් ඉඩම් කොමසාරිස්, නැගෙනහිර පළාත
11. දිලිත් ජයවීර මැතිතුමා<br>සභාපති, දෙරණ මාධ්‍ය ජාලය

නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායෙහි සාමාජිකයින් ලෙස මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් පත් කරමි.

1. නැගෙනහිර පළාත තුළ පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන හඳුනා ගැනීම.

2. එසේ හඳුනාගත් ස්ථාන හා පුරාවස්තු සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය කරමින්, එම පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා සුදුසු වැඩපිළිවෙලක් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

3. එම පුරාවිද්‍යාත්මක භූමි සඳහා වෙන් කළ යුතු ඉඩම් ප්‍රමාණ හඳුනා ගැනීම හා නිශ්චිතව හා නීත්‍යානුකූලව එම භූමි ප්‍රදේශ වෙන් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම

4. එම පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් භූමි ප්‍රදේශයන්හි සංස්කෘතිකමය වටිනාකම් සුරක්ෂිත කරමින් ශ්‍රී ලාංකීය අනන්‍යතාවය දේශීයව මෙන්ම ජාත්‍යන්තරව ප්‍රචලිත කිරීම සහ එකී උරුමයන් ප්‍රවර්ධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

**තවද, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා කාර්යසාධක බලකායේ සභාපති ලෙසත්,**

**ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ජීවන්තී සේනානායක මැතිතුමිය උක්ත කාර්යසාධක බලකායේ ලේකම් ලෙසත්,** පත් කරමි.

තවද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි කරුණු සොයා බැලීමට සහ උපදෙස් නිකුත් කිරීමට නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත මම මෙයින් බලය පවරමි.

තවද, නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වන ඔබට කලින් කලට මා හට වාර්තා ඉදිරිපත් කිරීමට මෙයින් බලය පවරමි.

තවද, නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා එබඳු සෙසු තැනැත්තන් විසින් තත් කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතු යැයිද, ලබාදිය හැකි සියලු සහාය සැලසිය යුතු යැයිද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයිද මම මෙයින් සියලුම රජයේ නිලධරයන්ට සහ සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

තවද, කිසියම් රාජ්‍ය සේවකයෙකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියෙකු විසින් පෙරකී කාර්යසාධක බලකාය විසින් පවරන ලද රාජකාරි හා වගකීම් ඉටු කිරීම ප්‍රමාද කරන හෝ පැහැර හරින සියලු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙරකී කාර්යසාධක බලකායට මම මෙයින් නියම කොට විධාන කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ ජුනි මස 01 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී.බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.